මගේ අංකය - ඩී03-මෝටර් රථ/ගිලන්රථ රියදුරු බඳවා ගැනීම
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2026.03.10

මූලස්ථාන අධිකාරී / සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය ( III ශ්‍රේණිය)**
**රියදුරු (දෙපාර්තමේන්තුගත) හා ගිලන් රථ රියදුරු තනතුරට සීමිත බඳවා ගැනීම - 2026**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු (දෙපාර්තමේන්තුගත) තනතුරු18ක් හා ගිලන් රථ රියදුරු තනතුරු 03ක් පුරප්පාඩු වී ඇති බැවින් දැනට මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ සේවයේ නියුතු, 2026.03.15 දිනට පහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් එකී තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරු සඳහා තෝරාගනු ලබන නිලධාරීන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු (දෙපාර්තමේන්තුගත) සහ ගිලන් රථ රියදුරු තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02. මෙයට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කර ගන්නා ලද අයදුම්පත් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව 2026.03.31 දිනට ප්‍රථම මා වෙත යොමු කළ යුතුය. අවශ්‍ය සුදුසුකම් නොමැති අයදුම්කරුවන් නියමිත ලෙස අයදුම්පත සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් සහ ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ .

03. වැටුප් ක්‍රමය -
~~වර්ෂයකට~~ PL-3-2025 (42780-10x490-10x540-10x590-12x630- 66540) ආරම්භක වැටුප් පියවරෙහි තබා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ. III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු වන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

04. අධ්‍යාපන සුදුසුකම් -
අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙක (02)ක් සහිතව විෂයන් හය (06)ක් සමත්ව තිබිය යුතුය.

05. වෘත්තීය සුදුසුකම් -
බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ **<u>ප්‍රාථමික ශ්‍රේණියේ</u>** තනතුරක ස්ථිර කර ඇති වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බර වාහන වලංගු බලපත්‍රයක් ලබා තිබීම.

- සතුටුදායක සේවා කාලය - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVII වන පරිච්ඡේදයේ 236 (i) හා (ii) වගන්තිවල සඳහන් කර ඇති පරිදි විය යුතුය.

06. පළපුරුද්ද -
මෝටර් රථ රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම. (ආදේශක රියදුරෙකු ලෙස සේවය කිරීම විශේෂ සුදුසුකමකි).

07. කායික සුදුසුකම් -

i. අවම උස අඩි 5 අඟල් 4 (පිරිමි) නොඅඩු විය යුතුය.
ii. අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32ක් විය යුතුය.

08. වෙනත් -

i. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
ii. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

09. බඳවා ගන්නා ක්‍රමය -

I. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය හා කාර්මික දැනුම. | 100% | 40% |

විෂය නිර්දේශය -

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණ ගැනීමේ ශක්තියන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. |
| කාර්මික දැනුම | වාහන නඩත්තුව සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |

II. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණය -

| විෂයයන් | උපරිමලකුණු ප්‍රමාණය | සමත්ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| i. මාර්ග නීති<br>ii. මාර්ග සංඥා<br>iii. මොටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් පත් කරනු ලබන පරීක්ෂකවරයෙකු, පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු සහ දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙකු විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය | 100% | 40% |

III. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)
මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණි.

ඉහත I හා II පරීක්ෂණ දෙකෙහි ලකුණුවල එකතුව මත දක්වන කුසලතා අනුපිළිවෙල අනුව එක් එක් තනතුර සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කරනු ලැබේ.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ)

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය ( III ශ්‍රේණිය)**
**රියදුරු (දෙපාර්තමේන්තුගත) තනතුරු සහ ගිලන් රථ රියදුරු තනතුරු සඳහා**
**සීමිත බඳවා ගැනීම - 2026**

(තනතුරු දෙකම අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍රය බැගින් අයදුම්පත් 02ක් ඉදිරිපත් කරන්න.)

01. අයදුම්කරන තනතුර :.....................................................................................
(රියදුරු (දෙපාර්තමේන්තුගත) / ගිලන් රථ රියදුරු)

02. i. මුලකුරු සමඟ නම :.....................................................................................

ii. මුලකුරුවලින් හැඳින්වෙන නම :.....................................................................................

03. ලිපිනය :.....................................................................................

04. ජාතික හැඳුනුම්පත් අංකය :.....................................................................................

05. දුරකථන අංකය : ආයතනය - ............................ පෞද්ගලික -...............................

06. අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස (සා.පෙළ)
(සහතිකවල ඡායා පිටපතක් අමුණන්න)
අ.පො.ස (සා.පෙළ) විභාග ප්‍රතිඵල

**I. පළමුවර**

වර්ෂය .........................

විභාග අංකය ..............................

| අනු අංකය | විෂයය | සමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

**II. දෙවනවර**

වර්ෂය .............................

විභාග අංකය..............................

| අනු අංකය | විෂයය | සමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

07. තනතුර (ප්‍රාථමික ශ්‍රේණිය) :.....................................................................................

I. තනතුර ස්ථිර කර තිබේද : .....................................................................................

II. ස්ථිර තනතුරට පත් වූ දිනය :.....................................................................................

III. 2026.03.15 දිනට සේවා කාලය :.....................................................................................

08. වලංගු රියදුරු බලපත්‍රයේ අංකය හා ශ්‍රේණිය :.....................................................................................
(වලංගු රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න)

I. පළපුරුද්ද (අවුරුදු) :.....................................................................................

Ii. විශේෂ සුදුසුකම් :.....................................................................................

09. කායික සුදුසුකම්

I. උස : අඩි: .............. අඟල්: ............

II. පපුව (හුස්ම නාල්ලා) : අඟල්:............

10. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයේ වසර 03 ඇතුළත අවවාද කිරීමකට වැඩි දඬුවමක් ලබා තිබේ ද සහ විසඳීමට විනය පරීක්ෂණ ඇත් ද යන වග :.......................................................................................

.......................................................................................................................................................

ඉහත මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය යැයි විභාගය පැවැත්වීමට පෙර හෙළිවුවහොත්, විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු වන බවත්, පත්වීම් දිනෙන් පසු අනාවරණය වුවහොත් මාගේ පත්වීම අවලංගු වන බවත් හොඳාකාරව දනිමි.

දිනය: .........................................

.............................................

අයදුම්කරුගේ අත්සන

---

**මූලස්ථාන අධිකාරී / බන්ධනාගාර අධිකාරී නිර්දේශය:**

............................................................................................................ යන අය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු විසින් 01 සිට 10 දක්වා සඳහන් කර ඇති කරුණු **සත්‍ය/ අසත්‍ය** බවත්, ඔහුගේ පැමිණීම, හැසිරීම **සතුටුදායක/ අසතුටුදායක** බවත් ................................ දින සිට ප්‍රාථමික ශ්‍රේණියේ ස්ථිර ................................ තනතුරෙහි සේවය කරන බවත්, විනය පරීක්ෂණයකින් දඬුවම් ලබා **ඇති/ නැති** බවත්, 2026.03.15 දිනට පූර්වාසන්න වසර 05ක කාලය තුළ නියමිත වැටුප් වර්ධක 05 උපයාගෙන **ඇති/ නැති** බවත්, එම කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර **ඇති/ නැති** බවත්, ඔහුට රියදුරු තනතුරේ විභාගයට පෙනී සිටීමට අවසර දීමට සුදුසුකම් සපුරා **ඇති/ නැති** බවත් සහතික කරමි. අයදුම්පත නිර්දේශ **කරමි/ නොකරමි**. (නිලධාරියාට විරුද්ධව විනය පරීක්ෂණ පවතින්නේ නම් හෝ පැවැත්වීමට අදහස් කරන්නේ නම් එම විස්තර වෙනම ඇතුලත් කළ යුතුය.)

දිනය: .......................................

...........................................

බන්ධනාගාර අධිකාරී

(අත්සන හා නිලමුද්‍රාව)